මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்தியமாகாணசபையின் அரசசேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොටපාර, මහනුවර.
இல. 244,கடுகஸ்தொட்டைவீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | |
|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர<br>Secretary | 081-2213096 |
| සහකාර ලේකම්<br>உதவிசெயலாளர்<br>Asst. Secretary | 081-2213097 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 08 1-2213082 |

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/15-18/TO/A.T.R-2026 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | |
| දිනය<br>திகதி<br>Date | 2025.10. 14 | | |

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සහා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන්වෙත,

**මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවය/ තාක්ෂණ සේවය සහ මෝටර් රථ රියදුරු සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු - 2026**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ **සංවර්ධන නිලධාරි සේවය, තාක්ෂණ සේවය සහ මෝටර් රථ රියදුරු සේවය** යන සේවාවන්ට අදාළ 2026 වසරේ වාර්ෂික ස්ථාන මාරුවීම් **2026.01.01** දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

02. අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති ඉහත සේවාවන්ට අදාළ නිලධාරින්ගේ 2026 වසරේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු නියෝග සහිත ලේඛනය භාගත කරගන්නා ලෙස මෙයින් දන්වන අතර ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන **ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් නව සේවා ස්ථානයේ 2026.01.01 දින රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි මුදාහැරිය යුතු බවද** කාරුණිකව දන්වමි.

03. එසේම, **2022,2023,2024 හා 2025 යන වර්ෂයන්හි වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබ මේ දක්වා නව සේවා ස්ථාන වෙත මුදා හැර නොමැති සංවර්ධන නිලධාරින් / තාක්ෂණ නිලධාරීන් සිටී නම් එම නිලධාරීන් නව සේවා ස්ථාන වෙත මුදාහරින ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.**

04. තවද, වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව ඔබ කාර්යාලය යටතේ ඇති උප කාර්යාල සහ වෙනත් සේවා ස්ථාන වෙත අනුයුක්ත කර ඇති සියළුම නිලධාරින් ද දැනුවත් කරන ලෙස සහ ඒ පිළිබඳ අභියාචනා ඇත්නම් අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති පහත සඳහන් **අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පතේ** ආකෘතිපත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර, ආයතන ප්‍රධානියා මඟින් පමණක් **2025.10.31** දිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත එවිය යුතු අතර, එදිනට පසුව ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් සලකා බැලීමක් සිදු නොකරන බවද, වැඩිදුරටත් සඳහන් කරමි.

කාරු. අ.පි.බ

| | |
|---|---|
| ම.ප./වා.ස්.මා./DO-02 | මධ්‍යම පළාත් **සංවර්ධන නිලධාරි** සේවයේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත |
| ම.ප./වා.ස්.මා./TO-02 | මධ්‍යම පළාත් **තාක්ෂණ සේවයේ** යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත |
| ම.ප./වා.ස්.මා./DRV-02 | මධ්‍යම පළාත් **මෝටර් රථ රියදුරු සේවයේ** යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත |

05. අභියාචනා තීරණයන්ට පසු අවසන් ස්ථාන මාරු නියෝග අනුව **2026.01.01 දින සිට ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක සියළුම නිලධාරින් 2025.12.31 දින සේවයෙන් පසු නව සේවා ස්ථාන වෙත අනිවාර්යයෙන් මුදාහැරිය යුතු** බව මෙයින් කාරුණිකව දන්වමි.

කේ.කේ.පී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත :
1. විගණකාධිපති - අ.ක.ස.